**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**
**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය 2021/2022**
**SOC 4178 – වෛද්‍ය සමාජ විද්‍යාව**

**කාලය : පැ දෙකයි (02)**

**ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.**

---

1. ජෛව වෛද්‍ය ප්‍රවේශයේ අභ්‍යුපගමයන් පැහැදිළි කර එහි සීමාවන් සෞඛ්‍ය හා රෝග පිළිබඳ සමාජ විද්‍යාත්මක පර්යාලෝකය ඇසුරින් විභාග කරන්න.

2. **එක්කෝ**

   කෘත්‍යවාදී පර්යාලෝකය කෙරෙහි විශේෂ අවධානය සහිතව, නූතන සමාජයේ වෛද්‍ය පද්ධතියේ භූමිකාව විවේචනාත්මකව විභාග කරන්න.

   **නැතහොත්**

   නූතන සමාජයේ පවත්නා සමාජ අසමානතාවන් ප්‍රතිස්ථම්භනය කිරීමට වෛද්‍ය ක්‍රමය දායක වන්නේ කෙසේදැයි දේශපාලන ආර්ථික පර්යාලෝකය කෙරෙහි විශේෂ අවධානය සහිතව විචාරාත්මකව විමසන්න.

3. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සංරක්ෂණ ව්‍යුහයේ (structure of healthcare) කෘත්‍යයන් වටහා ගැනීම සඳහා මානවවංශ වෛද්‍ය විද්‍යා ප්‍රවේශයේ ඇති වැදගත්කම විභාග කරන්න.

4. පුද්ගලයා එදිනෙදා ජීවිතයේ අත්විඳින ගැටලු වෛද්‍යකරණයට ලක් වී ඇත්තේ කෙසේදැයි **<u>එක්කෝ</u>** Nancy Scheper-Hughes ගේ "Death without weeping: The violence of everyday life in Brazil" යන අධ්‍යයනය (1993) **<u>නැතහොත්</u>** Cecilia Van Hollen ගේ "Birth on the threshold: Childbirth and modernity in South India" යන අධ්‍යයනය (2003) කෙරෙහි අවධානය සහිතව විචාරාත්මකව සාකච්ඡා කරන්න.

5. වත්මන් සෞඛ්‍ය අර්බුධ වලට ආමන්ත්‍රණය කිරීම සඳහා ජෛව-මනෝ සමාජීය ප්‍රවේශයක් යොදාගැනීම වැදගත් වන්නේ ඇයි? ශ්‍රී ලංකාවේ රෝගකාරක මූලය තහවුරු කර නොගත් නිදන්ගත වකුගඩු රෝගය (CKDu) ආශ්‍රිතව පැනනැගී ඇති ගැටලු පැහැදිළි කරන්න.

6. පහත සඳහන් මාතෘකා අතුරින් **ඕනෑම දෙකක් (02)** පිළිබඳ කෙටි රචනා ලියන්න.

(a) සෞඛ්‍ය අසමානතා පිළිබඳ ස්ත්‍රීවාදී පර්යාලෝකය.

(b) සෞඛ්‍ය විශ්වාස ආකෘතිය (Health belief Model) හා ප්‍රතිකාර අපේක්ෂිත චර්යාව.

(c) සෞඛ්‍ය පිළිබඳ සමාජ නිශ්චායක (Social determinants of Health) හා සමාජ පන්ති.

(d) ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා සැපයීමේ ක්‍රමය කෙරෙහි වත්මන් සමාජ-ආර්ථික අර්බුධයේ බලපෑම.

**************